www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ශ්‍රී ලංකාවේ ආන්ඩුව කොලඹ මහ නගර සභාව අහෝසි කිරීමට යයි

**Sri Lankan government to abolish Colombo Municipal Council**

**පානිනී විජේසිරිවර්ධන විසිනි**

**2010 සැප්තැම්බර් 27**

තවත් ප්‍රජාතන්ත්‍ර විරෝධී පියවරක් තබමින්, ශ්‍රී ලංකාවේ ආන්ඩුව, දිගුකාලීනව පැවති ඡන්දයෙන් තේරී පත් වූ ආයතනයක් වන කොලඹ මහ නගර සභාව අහෝසි කොට ඒ වෙනුවට ආරක්ෂක අමාත්‍යංශය මගින් පිහිටුවනු ලබන අධිකාරියක් පත් කිරීමට සැලසුම් කරයි. සුලු වසයෙන් හෝ නගරවාසීන්ට වග නොකියනු ඇති මෙම නව අධිකාරිය, සැලසුම්කරනය හා ඉදිකිරීම් ඇතුලුව, කොලඹ නගරය තුල පිලිවෙත් නියම කිරීම සඳහා ජාතික ආන්ඩුවට හා මිලිටරියට ඉඩ විවෘත කරනු ඇත.

නිවාස හා ඉදිකිරීම් ඇමති විමල් වීරවංශ විභව ආයෝජකයන් හා දේපොල සංවර්ධනකරුවන් වෙනුවෙන් සැප්තැම්බර් 12 දා පැවති රැස්වීමක දී යෝජිත වෙනස්කම් එලිදරව් කලේය. නව අධිකාරිය ව්‍යාපාර හා ඉදිකිරීම් සඳහා තල්ලුවක් සපයනු ඇතැයි ඔහු පුරසාරම් දෙඩීය. සැලසුම තවමත් නිල වසයෙන් නිවේදනය කොට නැතිමුත්, කොලඹ මාධ්‍ය පෙන්නුම් කල පරිදි, අදාල නව නීති කෙටුම්පත සැකසෙමින් තිබේ.

විපාර්ශ්වික එක්සත් ජාතික පක්ෂයේ (එජාප) පිටුබලය ලබන ස්වාධීන කන්ඩායමක ආධිපත්‍යය යටතේ වර්තමානයේ පවතින කොලඹ මහ නගර සභාවේ පාලනය සියතට ගැනීමට ආන්ඩුව මේ වන විටත් කිහිප වරක්ම ප්‍රයත්න දරා තිබේ. පාලක කන්ඩායම මිලට ගැනීමේ ප්‍රයත්න අසාර්ථක වීමෙන් පසු, බස්නාහිර පලාත් සභාවේ මහ ඇමති ප්‍රසන්න රනතුංග, නගර සභාවේ කාල සීමාව නිමා වීමට මාස අටකට පෙර, ජූනි මස නගර සභාව විසුරුවා හැරියේය.

පාලක ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සාමාජිකයකු වන රනතුංග, නගර සභාව - දූෂනය, දුෂ්පරිපාලනය හා අකාර්යක්ෂමතාව - සම්බන්ධයෙන් වරදකරු බවට තීන්දු කල පරීක්ෂනයක ප්‍රතිඵල ගසාකෑවේය. ශ්‍රී ලංකාවේ පාලනයේ සෑම මට්ටමක ම සුලභව පවතින දූෂනය මෙහි දී හුදු කඩතුරාවක් පමනි. ඉන් පසුව ජනාධිපති මහින්ද රාජපක්ෂ සිය පුලුල් විධායක බලතල භාවිතා කරමින්, නගර සභාවේ කටයුතු ගෙනයාම පිනිස විශේෂ නාගරික කොමසාරිස්වරයකු ලෙස, හිටපු නගරාධිපතිවරයකු වූ ඕමාර් කාමිල් පත් කලේය.

පලාත් පාලන ආයතනවලට දීර්ඝ ඉතිහාසයක් ඇත. 1865 දී බ්‍රිතාන්‍ය විජිත පාලනය යටතේ පිහිටුවන ලද කොලඹ මහ නගර සභාව 1936 දී මූලික සේවාවන් සැපයීම සම්බන්ධයෙන් වගකිව යුතු මුලුමනින්ම ඡන්දයෙන් තේරී පත් වන ආයතනයක් බවට පත්විය. 1954 දී, ඒ වන විටත් ට්‍රොට්ස්කිවාදී මූලධර්ම පිලිගෙන සිටි ලංකා සමසමාජ පක්ෂය (ලසසප) තවත් පලාත් පාලන ආයතන ගනනාවක් සමග කොලඹ නගර සභාවේ පාලනය ද දිනාගත්තේය. 1954 අගෝස්තුවේ දී ලසසප නායක එන්.එම්. පෙරේරා කොලඹ නගරාධිපති බවට පත්විය.

මෑත වසරවල දී, අනුප්‍රාප්තික ජාතික ආන්ඩු ජාත්‍යන්තර මූල්‍ය ප්‍රාග්ධනය ඉල්ලා සිටි වෙලඳ පොල-හිතැති න්‍යාය පත්‍රයේ කොටසක් ලෙස පොදු වියදම් කප්පාදු කර තිබේ. පලාත් පාලන ආයතනවලට ලබාදෙන සහනාධාර කප්පාදු කෙරී ඇත්තේ, බොහෝ සමාජ සේවාවන් කප්පාදු කිරීමේ හෝ මුලුමනින්ම අතහැර දැමීටම ඒවාට බල කරමිනි.

කොලඹ මහ නගර සභාව මහජන සෞඛ්‍ය සේවා, ඝන අපද්‍රව්‍ය කලමනාකරනය, මාර්ග නඩත්තුව, වීදි ආලෝකකරනය, ජල හා ජලාපවහන පද්ධති සහ පශු වෛද්‍ය සේවා සම්බන්ධයෙන් වගකීම දරයි. 2001 ජන සංගනනයට අනුව, යාබද උපනගර ප්‍රදේශ බැහැර කොට ගත් කල, කොලඹ නගරය තුල සිංහල, දෙමල, මුස්ලිම් හා බර්ගර් ජනවර්ග ඇතුලුව, 600,000කට අධික බහු-ජනවාර්ගික ජනගහනයක් සිටී. වර්ග කිලෝමීටර් 37ක් වන එහි බල ප්‍රදේශය තුල 66,000කට වැඩි පැල්පත් ඇතුලුව, නිවාස 120,000ක් තිබේ.

නගර සභාව අහෝසි කිරීමේ ආන්ඩුවේ තීන්දුව, කොලඹ නගරයෙන් සියලු පැල්පත්වාසීන් ඉවත් කොට හෙක්ටෙයාර් 390ක් ලෙස තක්සේරු කෙරෙන එම ඉඩම් දේපොල සංවර්ධකයන්ට භාර දීමේ ආන්ඩුවේ පුලුල් සැලසුම්වලට සම්බන්ධිතය. එම පැල්පත්වල

වෙසෙන පවුල්වලින් බොහොමයක් දශක ගනනාවක් තිස්සේ ඒවායේ ජීවත්ව ඇතත්, ආන්ඩුව එම පැල්පත් -අනවසර ඉදිකිරීම් - ලෙස හංවඩු ගසා ඇත. එහි ප්‍රතිඵලයක් ලෙස, ලක්ෂ පහකට ආසන්න ජනතාවකට, එනම් නගරයේ මුලු ජනගහනයෙන් බහුතරයකට, සිය නිවාස හා ජීවනෝපායන් අහිමි වනු ඇත.

පසුගිය වසරේ මැයි මස දෙමල ඊලම් විමුක්ති කොටි (එල්ටීටීඊ) සංවිධානයේ පරාජයෙන් පසුව ප්‍රකාශයට පත් කෙරුනු සිය "ආර්ථික යුද්ධයේ" කොටසක් ලෙස තමන් කොලඹ "දකුනු ආසියාවේ වානිජ මධ්‍යස්ථානයක්" බවට පත් කරන බව ජනාධිපති රාජපක්ෂ ප්‍රකාශ කර තිබේ. ගැඹුරු ආර්ථික අර්බුදයක් මධ්‍යයේ, ආන්ඩුව නගරයේ දුගී ජනයාගේ වියදමින් විදේශීය හා දේශීය ආයෝජකයන් ආකර්ෂනය කරගැනීම පිනිස පහසුකම් සැපයීමෙහි ලා මංමුලාසහගතව සිටී.

දේපොල සංවර්ධනය, විශේෂයෙන් ම කොලඹ නගරය තුල, අතිශය ලාභදායක ව්‍යාපාරයක් බවට පත්ව තිබේ. කොලඹ ඉඩම් පර්චස් එකක (වර්ග මීටර් 25ක) මිල රුපියල් මිලියනයක සිට මිලියන 8 දක්වා අගයක් දරයි. රාජපක්ෂ සහ ඔහුගේ ඥාතිමිත්‍රාදීහු මෙම ව්‍යාපාර තුල සමීපව සම්බන්ධව සිටිති. රජය සතු ඉඩම් පුද්ගලික අංශයට ලබාදීමේ තීන්දු "බලගතු ඇමතිවරු" අත තිබෙන බවට ඉදිකිරීම් කර්මාන්ත මන්ඩලයේ සභාපති සුරත් වික්‍රමසිංහ මෑත දී පැමිනිලි කලේය.

මැයි මස, ජනාධිපති රාජපක්ෂ, සිවිල් ආයතන දෙකක් වන, නාගරික සංවර්ධන අධිකාරිය සහ ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ මන්ඩලය, සිය සොහොයුරා වන ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂගේ පාලනය යටතේ පවතින ආරක්ෂක අමාත්‍යංශයේ අනසක යටතට පත් කලේය. අගෝස්තු 12 දා, කැබිනට් මන්ඩලය සියලු පැල්පත්වාසීන් ඉවත් කිරීමට ආරක්ෂක අමාත්‍යංශය ඉදිරිපත් කල සැලසුමක් අනුමත කලේය. එම තීන්දුව නිවේදනය කරමින්, වැඩ බලන මාධ්‍ය ඇමති අනුර ප්‍රියදර්ශන යාපා ප්‍රකාශ කලේ, එම පවුල් "කොලඹ නගරයේ ඉතා වටිනා ඉඩම්වල කිසි පිලිවෙලක් නැතිව" වාසය කරන බවයි.

ඉඩම්වලින් ඉවත් කෙරෙන අයට නව නිවාස ලබා දෙන බව ආන්ඩුව කියාසිටී. සැප්තැම්බර් 23 දා, නාගරික සංවර්ධන අධිකාරිය රුපියල් බිලියන 5ක් වටිනාකමකින් යුක්ත නයකර අලෙවියක් දියත් කලේ, එම අරමුදල්වලින් කොටසක් පැල්පත්වාසීන් සඳහා නිවාස ගොඩනැගීමට යොදා ගන්නා බව පවසමිනි. කෙසේවෙතත්, ආන්ඩුව කිසිදු සංයුක්ත සැලසුමක් නිවේදනය කර නැත. අතීතයේ දී, එලෙස ඉඩම්වලින් ඉවත් කිරීමෙන් පසුව යලි නිවාස ලැබී ඇත්තේ පවුල් සුලු සංඛ්‍යාවකට පමනි.

කොලඹ නගරය ආරක්ෂක අමාත්‍යංශය මගින් පාලනය කෙරෙන නව අධිකාරියක් යටතට පත් කිරීමේ ආන්ඩුවේ සැලසුමේ එල්ලය වන්නේ, පැල්පත්වාසීන් ඉවත් කිරීමට එරෙහිව මතුවන මොන යම් හෝ ප්‍රතිරෝධයක් තලාදැමීමයි. මැයි මස මුල දී, කොලඹ නගර මධ්‍යයේ කොම්පඤ්ඤවීදියේ පවුල් 45ක නිවාස කඩාදැමීමට එරෙහි විරෝධතා මර්දනය කරනු පිනිස පොලීසිය හා හමුදාව යෙදවීය. ජූලි මස මුල දී, ප්‍රදේශයේ තරුනයකු අත්අඩංගුවට ගෙන පහරදීම සම්බන්ධයෙන් ප්‍රාදේශීය පොලිස් ස්ථානය අසල කෝපාවිෂ්ට විරෝධතාවකට පසුව කොලඹ මට්ටක්කුලිය ප්‍රදේශයේ පැල්පත්වාසීන් 8,000ක් පමන පොලිස් භටයන් හා සොල්දාදුවන් සිය ගනනක් විසින් අත්අඩංගුවට ගන්නා ලදි.

ආන්ඩුව පැල්පත්වාසීන් ඉවත් කිරීමට එරෙහි වීමේ මොන යම් හෝ නීතිමය මාර්ගයක් අවහිර කිරීමට ද සූදානම් වේ. නාගරික සංවර්ධන අධිකාරිය, ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂගේ මගපෙන්වීම මත, නාගරික සංවර්ධන අධිකාරි පනතට සංශෝධන කෙටුම්පත් කිරීමට කමිටුවක් පත් කර තිබේ. රජය-සතු ඩේලි නිව්ස් පත්‍රයේ සැප්තැම්බර් 15 කලාපයට අනුව, එම සංශෝධන, "අනවසර ඉදිකිරීමේ ඉවත් කිරීමෙහිලා ඍජුවම මැදිහත්වීමේ ද ඒවා ඉවත් කිරීමට උසාවි අනුමැතිය ගැනීම පිනිස නාගරික සංවර්ධන අධිකාරියට වැය කිරීමට සිදුවන අතිරේක වියදම් කපාදැමීමේ ද හැකියාව නාගරික සංවර්ධන අධිකාරියට ලබා දෙනු" ඇත.

කොලඹ මහ නගර සභාව අහෝසි කිරීම මූලික ප්‍රජාතන්ත්‍ර අයිතීන්ට එරෙහිව එල්ල කෙරෙන වඩා පුලුල් ප්‍රහාරයක කොටසකි. මේ මස මුල දී, ආන්ඩුව, මූලික තනතුරුවලට පත්කිරීම් සිදු කිරීමේ ඉඩකඩ ජනාධිපතිට පවරන සහ තනි පුද්ගලයකුට ජනාධිපති තනතුරු දැරීමට හැකි වාර දෙකේ සීමාව ඉවත් කරන 18 වන ව්‍යවස්ථා සංශෝධනය පාර්ලිමේන්තුව තුලින් තල්ලු කරගත්තේය. ජාත්‍යන්තර මූල්‍ය අරමුදල ඉල්ලා සිටින දරුනු කප්පාදු පිලිවෙත් පටවනු වස් සිය පාලක කට්ටුව අත බලය සංකේන්ද්‍රනය කරගැනීමේ රාජපක්ෂ යෙදී සිටී.

ප්‍රධාන විරුද්ධ පක්ෂ, එජාප සහ ජනතා විමුක්ති පෙරමුන (ජවිපෙ), ප්‍රජාතන්ත්‍ර අයිතීන් ආරක්ෂා කරගැනීමේ කිසිදු බැරෑරුම් උද්ඝෝෂනයක් ගෙනගොස් නැත. සැප්තැම්බර් 18 දා පැවති ප්‍රවෘත්ති සාකච්ඡාවක දී කතා කරමින්, එජාප මහ ලේකම් තිස්ස අත්තනායක, පූර්වානම් සහගතව, කොලඹ මහ නගර සභාව අහෝසි කිරීමේ සැලසුම "මුලුමනින්ම ප්‍රජාතන්ත්‍ර විරෝධී පියවරක්" ලෙස හංවඩු ගැසූ අතර එජාප "ආන්ඩුවේ එම පියවරට එරෙහිව රට පුරා විරෝධතා ව්‍යාපාරයක්

සංවිධානය කිරීමට කටයුතු කරන" බව ද ප්‍රකාශ කලේය.

එලෙසම, *ඉරුදින* පත්‍රයට දුන් සම්මුඛ සාකච්ඡාවක දී, ජවිපෙ නායක අනුර කුමාර දිසානායක, ආන්ඩුව තමන්ට මැතිවරනවලින් දිනාගත නොහැකි පලාත් පාලන ආයතන පවරාගැනීමට කටයුතු කරන බවට චෝදනා කලේය. ජවිපෙ සහ එහි ප්‍රජාතන්ත්‍රවාදී ජාතික සන්ධානය "ආන්ඩුවේ ප්‍රජාතන්ත්‍ර විරෝධී පියවරවලට එරෙහිව විරුද්ධ පක්ෂ සමග පොදු ක්‍රියාමාර්ගයක්" දියත් කිරීමට බලාපොරොත්තු වන බව ද ඔහු ප්‍රකාශ කලේය.

මෙම ප්‍රකාශ ගැන කිසිදු විශ්වාසයක් නොතැබිය යුතුය. එජාපයට හා ජවිපෙට ආන්ඩුවේ වෙලඳ පොල හිතැති න්‍යාය පත්‍රය සමග මූලික මතභේද නැති අතර, එම පක්ෂ දෙකටම ප්‍රජාතන්ත්‍ර විරෝධී භාවිතාවන් පිලිබඳ දීර්ඝ කාලීන වාර්තාවක් පවතී. 18 වන සංශෝධනයට ඔවුන් දක්වන විරුද්ධත්වය හුදු නාමික විරෝධතාවකට වැඩි දෙයක් නොවේ. එජාප පාර්ලිමේන්තුවේ ඡන්ද විමසීම වර්ජනය කල අතර පක්ෂ නායක රනිල් වික්‍රමසිංහ පක්ෂයේ තරුන සංවිධානයට උපදෙස් දුන්නේ "මහජන බලය" ප්‍රකාශ කිරීමේ විධික්‍රමයක් ලෙස එම ඡන්ද විමසීමෙන් මසක් ගෙවෙන දින බුදුන්ට යාඥා කරන ලෙසයි.

පැල්පත්වාසීන්ට සිය මූලික අයිතීන් ආරක්ෂා කරගැනීම පිනිස මෙම ධනේශ්වර විරුද්ධ පක්ෂ මත විශ්වාසය තැබිය නොහැකිය. ඔවුහු ස්වාධීනව බලමුලුගැන්වීම ආරම්භ කල යුතුය. පැල්පත්වාසීන් සිය ඉඩම්වලින් පලවාහැරීමට විරුද්ධ වීම සහ එවන් මෙහෙයුම් හා එසේ අත්පත් කරගත් ඉඩම්වල මොන යම් හෝ සංවර්ධන ව්‍යාපෘතියක් වර්ජනය කිරීම මගින් නාගරික දුගී ජනයාගේ සහයෝගයට එන ලෙස සමාජවාදී සමානතා පක්ෂය (සසප) කම්කරු පන්තියෙන් ඉල්ලා සිටී. මෙම උද්ඝෝෂනය, කම්කරු-ගොවි ආන්ඩුවක් ද ධනවත් අතලොස්සකගේ ලාභ අවශ්‍යතා නොව වැඩ කරන ජනයාගේ අවශ්‍යතා සපුරාලනු පිනිස සමාජය යලි ගොඩනැගීමේ සමාජවාදී පිලිවෙත් ද සඳහා වන වඩා පුලුල් අරගලයක කොටසක් විය යුතුය. සසප සටන් වදින්නේ මෙම ක්‍රියාමාර්ගය උදෙසාය.

© www.wsws.org